සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
Provincial Department of Education - NWP

11 ශ්‍රේණිය | තෙවන වාර පරීක්ෂණය - 2024 | 33 S I

නම: ........................................ | ඉතිහාසය | කාලය පැය එකයි

උපදෙස්
- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.
- එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා ඒවා ද පිළිපදින්න.

01. මහාවංසයේ මුල්කොටස රචනා කරන ලද මහානාම හිමියන් වැඩ වාසය කළ පිරිවෙන වන්නේ,
1. කොටහේනේ දීපදුත්තාරාමය යි.
2. අනුරාධපුර දික්සඳ සෙනෙවියා පිරිවෙන යි.
3. මාලිගාකන්දේ විද්‍යෝදය පිරිවෙන යි.
4. රත්මලානේ පරමධම්මචේතිය පිරිවෙන යි.

02. ශ්‍රීලංකාවට නොපැමින අසා දැනගත් තොරතුරු පදනම් කරගෙන ලංකාව පිළිබඳ රචනා කරන ලද ග්‍රීක මූලාශ්‍රය වන්නේ කුමක්ද?
1. මෙගස්තිනිස්ගේ ඉන්ඩිකා කෘතිය
2. ප්ලිනිගේ නැචුරලිස් හිස්ටෝරියා කෘතිය
3. ටොලමිගේ භූගෝලශාස්ත්‍ර ප්‍රවේශය
4. රිබෙයිරෝගේ ලංකාව පිළිබඳ ග්‍රන්ථය

03. ශ්‍රී ලංකාවේ ගල් යුගයට අයත් සාක්ෂි හමුවන ඉරණමඩු සැකැස්ම පිහිටි පරිසර කලාපය වන්නේ,
1. කඳුකර වියළි කලාපය යි.
2. පහතරට වියළි කලාපය යි.
3. ශුෂ්ක කලාපය යි.
4. අර්ධ ශුෂ්ක කලාපය යි.

04. මුල් ඓතිහාසික යුගයට අයත් පුරාණ නිවාසයකට අයත් නටබුන් හමු වී ඇති ස්ථානයක් දැක්වෙන පිළිතුර කුමක් ද?
1. හල්දුම්මුල්ල
2. උඩරංචාමඩම
3. වළගම්පත්තුව
4. බෙරගල

05. අතීත ගම්වල නායකයින් එකිනෙක සුහදව කටයුතු කළ බවට තොරතුරු ලබාගත හැකි සෙල්ලිපිය වන්නේ,
1. කළුදියපොකුණ සෙල්ලිපිය යි.
2. කොණ්ඩවට්ටවාන් සෙල්ලිපිය යි.
3. කොත්ගල්කන්ද සෙල්ලිපිය යි.
4. සිතුල්පව්ව කොරවක්ගල අසල සෙල්ලිපිය යි.

06. පහත I තීරුවේ රජවරු කිහිප දෙනෙකුගේ නම් හා II තීරුවේ එම රජවරු සම්බන්ධ කරුණු කිහිපයක් දැක්වේ. I තීරුව අනුව II තීරුව ගැලපූ විට නිවැරදිපිළිතුර කුමක්ද ?

| I තීරුව | II තීරුව |
|---|---|
| 1. වසභ රජු | A වේලෙක්කාර හමුදාව ගෙන්වීම |
| 2. I විජයබාහු රජු | B මාතොට අන්තර්ජාතික වරාය විදේශිය අණසකින් මුදාගැනීම |
| 3. දුටුගැමුණු රජු | C බදු අයකිරීම ක්‍රමවත් කිරීම |

1. ABC
2. BAC
3. CAB
4. CBA

07. දේශපාලන බලය විමධ්‍යගතව පැවති අවධියේ රජු හැඳින්වීමට භාවිත කරන නම කුමක්ද ?.
1. මපුරුමුකා
2. රජ
3. පොචනි රජ
4. මහරජ

08. හම්බන්තොට දිස්ත්‍රික්කයට අයත් මණ්ඩගල නම් ස්ථානයේ ඇති සෙල්ලිපියෙන් හෙළිවන්නේ අතීතයේ පැවති කුමන කර්මාන්තයක් පිළිබඳවද ?.
1. රන්
2. යකඩ
3. තඹ
4. රෙදිපිළි

09. කිරිමඩු ශාන්තිකර්මය පවත්වන්නේ කුමක් අරමුණු කරගෙන ද?.
1. මිනිසුන් අතර පැතිර යන වසංගත රෝග වැළැක්වීම උදෙසා ය.
2. වගාවලට වැළඳෙන කෘමි උවදුරු වැලැක්වීම සඳහා ය.
3. වගා කටයුතු ඇරඹීම සඳහා ය.
4. ගවයන්ගේ ආරක්ෂාව සඳහා ය.



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers - Model Answers - Study Resources
iexamhub

10. ඇදිගම සූතිඝර චෛත්‍යයේ ධාතු ගර්භයෙන් සොයා ගන්නා ලද පහන නිර්මාණය වී ඇති ලෝහය වන්නේ,
1. යකඩ ය. 2. ලෝකඩ ය. 3. රිදී ය. 4. තඹ ය.

11. ජලාශවල ජීවත්වන පක්ෂීන් නොමැරිය යුතු බවට නීතියක් පනවන ලද රජු වන්නේ කවුරුන් ද ?
1. අමණ්ඩගාමිණී අභය රජතුමා 2. iv වන මිහිඳු රජතුමා
3. නිශ්ශංකමල්ල රජතුමා 4. iv වන උදය රජතුමා

12. පහත සඳහන් පාලකයන් අතරින් කාලිංග වංශයට අයත් නොවන්නේ කව්ද ?
1. ලීලාවතී බිසව 2. . කල්‍යාණවතී බිසව 3. චෝඩගංග 4. සාහස්සමල්ල

13. දෙවන පරාක්‍රමබාහු රජු හා චන්ද්‍රභානු අතර ඇති වූ සටන අවස්ථාවේ ලාංකික රජුට ආධාර ලබාදුන් රාජ්‍ය කුමක්ද ?
1. චෝල 2. පාණ්ඩ්‍ය 3. කාලිංග 4. බුරුම

- පහත A සිට E දක්වා ඇති තොරතුරු ඇසුරෙන් 14 හා 15 ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

A - ප්‍රධාන පාලන මධ්‍යස්ථානයට අමතරව ප්‍රාදේශීය පාලන මධ්‍යස්ථාන ක්‍රියාත්මක වීම.
B - සද්ධර්මරත්නාවලිය, පූජාවලිය යන ග්‍රන්ථ ලියවීම.
C - කාලිංගරායර හා චෝඩගංග ආක්‍රමණ සිදුවීම.
D - චෙංහෝ සෙන්පතියාගේ ආක්‍රමණය සිදුවීම.
E - පන්සිය පනස් ජාතක පොත සිංහලට පරිවර්තනය කිරීම.

14. ගම්පොළ රාජ්‍ය සමයට අදාළ සිදුවීම් දැක්වෙන පිළිතුරු යුගලය කුමක්ද ?
1. A හා C 2. B හා D 3. A හා D 4. C හා E

15. දඹදෙණි රාජ්‍ය සමයට අදාළ සිදුවීම් දැක්වෙන පිළිතුරු යුගලය කුමක්ද ?
1. A හා B 2. B හා C 3. B හා D 4. C හා E

16. කෝට්ටේ රාජධානියේ VIII වන වීර පරාක්‍රමබාහු නමින් රාජ්‍යත්වයට පත් වූයේ කවුරුන් ද ?
1. අම්බුළුගල කුමරු 2. සපුමල් කුමරු 3. මහා අස්ථාන කුමරු 4. ටිකිරි කුමරු

17. යාපනය රාජධානිය පිළිබඳ තොරතුරු ලබාගැනීමට යොදාගත නොහැකි මූලාශ්‍රය වන්නේ කුමක් ද ?
1. යාල්පානවෛපමාලෛ 2. ශේගරාසශේමෙරමාලෛ
3. කෛලායමාලෛ 4. සරජෝතිමාලෛ

18. මහනුවර රාජධානිය ලංකාවේ අග නගරය බවට පත් කර ගනිමින් නව රාජවංශයක් ආරම්භක කළ පාලකයා කවුරුන් ද?
1. සේනාසම්මත වික්‍රමබාහු රජු 2. කීර්ති ශ්‍රී රාජසිංහ රජු
3. I විමලධර්මසූරිය රජු 4. ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජු

19. ශ්‍රී වික්‍රම රාජසිංහ රජු තම රාජධානිය තුළම අනාරක්ෂිතයකු බවට පත්වීමට බලපෑ හේතු අතරෙන් ප්‍රධානතම හේතුව වූයේ,
1. රජු සුරාලෝලියකු වීම ය.
2. ප්‍රභූ පන්තිය හා මහජනතාව රජුට එරෙහි වීම ය.
3. රජු භික්ෂු ඝාතනය කිරීම ය.
4. ප්‍රභූ පන්තිය ඉංග්‍රීසින්ට උදව් කිරීම ය.

20. මධ්‍යතන යුගයේ දී යුරෝපා රටවල භාවිත වූ භාෂාව වූයේ,
1. ග්‍රීක භාෂාව යි. 2. ලතින් භාෂාව යි. 3. අරාබි භාෂාව යි. 4. ගෝත්‍රික භාෂාව යි.

21. සෞරග්‍රහ මණ්ඩලයේ ග්‍රහලෝක සූර්යයා වටේ ඉලිප්සාකාරව ගමන් ගන්නා බව සොයා ගනු ලැබූ පුද්ගලයා කව්ද ?
1. ජොහැන්ස් කෙප්ලර් 2. නිකලස් කොපර්නිකස් 3. ගැලිලියෝ ගැලිලි 4. අයිසෙක් නිව්ටන්

22. ශ්‍රී ලංකාවේ මුලින් ම කුරුඳු වගාකරන ලද්දේ,
1. පෘතුගීසී ජාතිකයින් ය. 2. ඉංග්‍රීසී ජාතිකයින් ය
3. ලන්දේසී ජාතිකයින් ය. 4. ප්‍රංශ ජාතිකයින් ය.

23. උඩරටට එල්ල කළ පෘතුග්‍රීසි ප්‍රහාරයන් වලදී සෘජුවම උඩරට රජු සම්බන්ධ නොවූ සටන කුමක්ද ?
1. දන්තුරේ 2. බලන 3. රන්දෙනිවෙල 4. ගන්නොරුව



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub

24. ක්‍රි.ව. 1619 දී යාපනයට යවනු ලැබූ පෘතුග්‍රීසි හමුදාවේ ප්‍රධානත්වය ගන්නා ලද්දේ කවුරුන් විසින්ද ?
1. බැරන් වැන් එක් 2. පිලිප් ද ඔලිවේරා
3. පේරෝ ලෝපේස් ද සූසා 4. දොන් ජෙරනිමෝ ද අසවේදු

• පහත I තීරුවේ කාර්මික විප්ලවය සමයේ නව සොයාගැනීමේ හා II තීරුවේ එම සොයාගැනීම් කල පුද්ගලයන් දැක්වේ. වගුව ඇසුරෙන් 25, 26, 27 ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

| 1 තීරුව | 2 තීරුව |
|---|---|
| A මියුල් යන්ත්‍රය | D නිව් කොමන් |
| B වාෂ්ප එන්ජිම | E හෙන්රි කෝට් |
| C රෝලර් යන්ත්‍රය | F සැමුවෙල් ක්‍රොම්ප්ටන් |

25. පේෂ කර්මාන්තය හා සම්බන්ධ නව සොයාගැනීම හා පුද්ගලයා ඇතුළත් පිළිතුර කුමක් ද ?
1. A හා D 2. B හා F 3. A හා F 4. C හා E

26. යකඩ හා වානේ කර්මාන්තය හා සම්බන්ධ නව සොයා ගැනීම හා පුද්ගලයන් ඇතුළත් පිළිතුර කුමක්ද ?
1. A හා E 2. B හා F 3. C හා D 4. C හා E

27. ගල් අඟුරු කර්මාන්තය හා සම්බන්ධ නව සොයාගැනීම හා පුද්ගලයා ඇතුළත් පිළිතුර කුමක්ද ?
1. B හා F 2. A හා E 3. C හා D 4. B හා D

28. 1818 නිදහස් අරගලයට බලපෑ හේතුවක් නොවන්නේ කුමක්ද ?
1. උඩරට ප්‍රභූ පන්තියට පහර වැදීම 2. රජෙකු නොමැති වීමේ පසුතැවිල්ල
3. ආගම සංස්කෘතියට පහර වැදීම 4. ගම්සභාව අඩපණ වීම

• A සීමිත ඡන්ද බලය හඳුන්වා දීම.
• B තිලනොලත් පිරිස බහුතරය බවට පත්කිරීම.

29. කෲව් මැකලම් ආණ්ඩුක්‍රමය සම්බන්ධයෙන්
1. A සත්‍යයි B අසත්‍යයි. 2. A අසත්‍යයි B සත්‍යයි.
3. A හා B සත්‍යයි. 4. A හා B අසත්‍යයි.

30. මෙරටට පැමිණි මිෂනාරි කණ්ඩායම් අතරින් මාසික තෑග්ග නැමැති කෘතිය ප්‍රකාශයට පත් කළ මිෂනාරි සමාගම කුමක් ද?
1. බැප්ටිස්ට් මිෂනාරි සමාගම 2. චර්ච් මිෂනාරි සමාගම
3. ඇමරිකන් මිෂනාරි සමාගම 4. වෙස්ලියන් මිෂනාරි සමාගම

31. ඉංග්‍රිසින් යටතේ ලූල්කඳුර වතුයාය යොදාගනු ලැබුවේ කුමන වගාවක් සම්බන්ධයෙන් ද?
1. කෝපි 2. කොකෝවා 3. තේ 4. රබර්

32. ස්වීඩන් රජයේ ආධාරයෙන් මෙරට ඉදිකරන ලද්දේ,
1. කොත්මලේ ජලාශය යි 2. වික්ටෝරියා ජලාශය යි 3. රන්දෙනිගලජලාශය යි 4. මාදුරුඔය ජලාශය යි

• ලෝකයේ ප්‍රධාන විප්ලව සම්බන්ධ තොරතුරු කිහිපයක් පහත දැක්වේ. ඒවා ඇසුරෙන් 33 හා 34 ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

A - සාමය, ඉඩම්, ආහාර
B - නිදහස, සමානාත්මතාවය, සහෝදරත්වය
C - සීනි බද්ද පැනවීම
D - ඩූමාව නමින් මන්ත්‍රණ සභාවක් ක්‍රියාත්මක වීම
E - නියෝජනයක් නැත්නම් බදුන් නැත

33. ඇමරිකන් නිදහස් සටන හා සම්බන්ධ තොරතුරු ඇතුළත් පිළිතුර කුමක් ද?
1. A හා C 2. B හා C 3. B හා D 4. C හා E

34. රුසියන් විප්ලවය හා සම්බන්ධ තොරතුරු ඇතුළත් පිළිතුර කුමක් ද?
1. A හා C 2. B හා D 3. A හා D 4. B හා E



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

• පහත A, B, C, D වලින් දැක්වෙන ප්‍රකාශ/ පද යුගල අධ්‍යයනය කර 35 සිට 38 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

A 1 ලංකාවට පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයක් ලැබීම
  2 පුනරුදය

B 1 දේශගවේෂනය
  2 කොන්ස්තන්තිනෝපලය තුර්කීන් අල්ලා ගැනීම

C 1 පළමු ලෝක සංග්‍රාමය
  2 එක්සත් ජාතීන්ගේ සංවිධානය

D 1 ජර්මනිය පෝලන්තයට පහර දීම
  2 දෙවන ලෝක සංග්‍රාමය

35.පළමුවැන්න දෙවැන්න අතර සම්බන්ධතාවයක් නොපෙන්වන ප්‍රකාශ/ පද යුගලය කුමක් ද ?
   1. A   2. B   3. C   4. D

36. දෙවැන්නේ ආරම්භයට පලමුවැන්න හේතු වූ බව දැක්වෙන ප්‍රකාශ/ පද යුගලය කුමක් ද ?
   1. A   2. B   3. C   4. D

37. දෙවැන්නෙහි ප්‍රතිඵලයක් ලෙස පළමුවැන්න සිදුවීම දැක්වෙන ප්‍රකාශ/ පද යුගලය කුමක් ද ?
   1. A   2. B   3. C   4. D

38. දෙවැන්නෙහි ක්‍රියාකාරිත්වය පළමුවැන්නට හේතුවක් වූ බව දැක්වෙන ප්‍රකාශ/ පද යුගලය කුමක් ද ?
   1. A   2. B   3. C   4. D

39. අත්ලාන්තික් ප්‍රඥාප්තියට අත්සන් කළ නායකයන් දෙපල වන්නේ කව්ද ?
   1. වින්සන්ට් චර්චිල් හා ෆ්රැන්ක්ලින් රූස් වෙල්ට්
   2. ෆ්රැන්ක්ලින් රූස්වෙල්ට් හා ජෝසප් ස්ටාලින්
   3. වින්ස්න්ට් චර්චිල් හා වුඩ්රෝ විල්සන්
   4. ඕලැන්ඩෝ විටෝරියෝ හා ක්ලෙමන් ෂෝ

40. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මහලේකම් කාර්යාලය පිහිටියේ,
   1. ජිනිවා නුවර ය.
   2. නිව්යෝර්ක් නුවර ය.
   3. පැරිස් නගරයේ ය.
   4. ලන්ඩන් නගරයේ ය.



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers   Model Answers - Study Resources
iexamhub

සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்**
**Provincial Department of Education - NWP**

**11 ශ්‍රේණිය** | **තෙවන වාර පරීක්ෂණය - 2024** | **33 S II**

**නම: ..........................................** | **ඉතිහාසය** | **කාලය පැය තුනයි**

**උපදෙස්**
- **I කොටසෙහි පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **II කොටසින් ප්‍රශ්න හතරකටද, III කොටසින් ප්‍රශ්න එකකට ද පිළිතුරු සපයන්න.**
- **පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව හයකි.**

## I කොටස

01. (අ) පහත (i) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ශ්‍රී ලංකා සිතියමෙහි ද (ii) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම පසයා ඇති ලෝක සිතියම් කොටසෙහි ද ලකුණු කර නම් කරන්න.

(i) ගල්ඔය ජලාශය, පදවිය වැව, කිරිදිඹය, දැදුරු ඔය, මාතොට, කාලතිත්ථ, පුලතිසිපුර, ඉබ්බන්කටුව, යාපනය, ගාලුවරාය, පල්ලවංකය, මිනිහාගල්කන්ද (ල. 12)

(ii) වැනීසිය, බොම්බාය, මධ්‍යධරණී මුහුද, සියම් දේශය, මක්කම, කොරියානු අර්ධද්වීපය (ල. 6)

(ආ) පහත A, B, C, D යටතේ දක්වා ඇති ප්‍රශ්න වලට අදාළ පිළිතුරු අනුපිළිවෙළින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියා දක්වන්න.

A - දඹදෙණියෙහි කෙටි කලක් රජකොට පාලන මධ්‍යස්ථානය යාපහුවට මාරු කළ පාලකයා.
B - කාර්මික විප්ලව සමයේ එංගලන්තයේ ආරම්භ වූ නව තැපැල් සේවය හැඳින්වූ නම
C - කෝට්ටේ VI බුවනෙකබාහු රාජ්‍ය සමයේ දී පස්යොදුන් රට ඇති වූ කැරැල්ල හඳුන්වන ලද නම.
D - ක්‍රි.ව. 1492 කැරිබියන් මුහුදේ බහාමාස් දිවයින් වලට ගොඩබසින ලද දේශ ගවේෂකයා. (ල. 4)

- A හා B යටතේ දක්වා ඇති පින්තූර අධ්‍යනය කොට අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු අනුපිළිවෙළින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න.

(ii) (i) A රූපයේ දැක්වෙන නිර්මාණය කුමක් ද?
(ii) එය දැකගත හැක්කේ කුමන නගරයක් ආසන්නයේ ද?
(ii) මෙය ඉදිකර ඇත්තේ කුමන ගංගාවක් හරහා ද?
(iv) මෙම නටබුන් මගින් අනාවරණය කරගත හැකි තාක්ෂණික ක්ෂේත්‍රය කුමක් ද? (ල. 4)


A


B

(iii) (i) B රූපයේ දැක්වෙන පුද්ගලයා හඳුනාගෙන නම් කරන්න.
(ii) ඔහු හඳුන්වන අන්වර්ථ නාමය කුමක් ද?
(iii) නිදහස් ලංකාවේ මෙතුමාට හිමිවූ සුවිශේෂ තනතුර කුමක් ද?
(iv) මෙතුමා විසින් ආරම්භ කරන ලද බහුකාර්ය සංවර්ධන යෝජනා ක්‍රමය කුමක් ද? (ල. 4)



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub

## II කොටස

02. (i) ප්‍රාග් ඓතිහාසික මානවයන් ජනාවාස පිහිට වූ පරිසර කලාප අතරින් ලංකාවේ දකුණු අර්ධ ශුෂ්ක කලාපයට අයත් කැණීම් කරන ලද ස්ථාන 03 ක් නම් කරන්න. (ල. 3)
(ii) පූර්ව ඓතිහාසික යුගයට අයත් සුසාන විධි පිළිබඳ සාධක හමු වූ ස්ථාන 04 ක් ලියා දක්වන්න. (ල. 4)
(iii) පූර්ව ඓතිහාසික යුගයේ උසස් තාක්ෂණයක් පැවති බව එම යුගයේ වැසියන් තාක්ෂණය භාවිත කළ අවස්ථා 02 ක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ල. 5)
(iv) මුල් ඓතිහාසික යුගයේ ජනවාස ව්‍යාප්තියේ දී සලකා බලනු ලැබූ කරුණු 03 ක් දක්වා පැහැදිලි කරන්න. (ල. 6)

03.(i) පහත සිදුවීම්හා සම්බන්ධ පාලකයින් නම් කරන්න.
A - අශෝක අධිරාජයා සමග මිත්‍ර සබඳතා ඇතිකර ගැනීම
B - චේර රාජ්‍යයේ පත්තිනි දේවාලයක් විවෘත කිරීමට සහභාගී වීම
C - චීනය සමග විසි වතාවක් දූත සබඳතා පැවැත් වීම (ල. 3)
(ii) පණ්ඩුකාභය රජු විසින් සිදුකරන ලද සේවාවන් 02 ක් ලියා දක්වන්න. (ල. 4)
(iii) අතීත ලංකාවේ පරුමකගෙන් ඉටු වූ කාර්යන් දෙකක් දක්වා ඒ පිළිබඳ පැහැදිලි කරන්න. (ල. 5)
(iv) අතීතයේ දී මෙරට දියුණු වෛද්‍ය සේවාවක් පැවති බව කරුණු 03 ක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ල. 6)

04. (i) අතීත ශ්‍රී ලංකාවේ පැරැන්නන් අවකාශය මැනීම සඳහා භාවිත කල මිම් වර්ග 03 ක් සඳහන් කරන්න. (ල. 3)
(ii) පහත දැක්වෙන යෙදුමත් සඳහා අතීතයේ සෙල්ලිපි වල භාවිත වූ නම් වරහන් තුලින් තෝරා ලියා දක්වන්න.
A- ව්‍යවස්ථාදායකය B- අධිකරණය
C- හස්එබු කාසි D- මොහොළ
(නීති විශාරදයින්, කහාපණ, දියකැට පහන, සභාව, වදාළ, වෛද්‍යවරු, කහවනු) (ල. 4)
(iii) අතීත ශ්‍රී ලංකාවේ වාස්තු විද්‍යාව ඉතා දියුණු මට්ටමක පැවති බව උදාහරණ 02 ක් ඉදිරිපත් කරමින් පැහැදිලි කරන්න. (ල. 5)
(iv) සමාජයක් යහපත්ව පවත්වාගෙන යාම සඳහා නීතිය විවිධ අංශ යටතේ ක්‍රියාත්මක වූ බව අතීත ලංකාවේ නීතිය ක්‍රියාත්මක අංශ 03 ක් දක්වමින් පැහැදිලි කරන්න. (ල. 6)

05. (i) පලමු නාගරිකරණයට අයත් පාලන මධ්‍යස්ථාන 03 ක් ලියා දක්වන්න. (ල. 3)
(ii) ක්‍රි.ව. 1215 දි සිදු වූ කාලිංග මාඝ ආක්‍රමණයෙන් පසු ලංකාවේ නිරිත දිග ප්‍රදේශවල බිහි වූ පාලන මධ්‍යස්ථාන A, B, C, D ලෙස දැක්වේ. ඒවායේ පාලකයන් ලියා දක්වන්න. (ල.4)
A - මිණිපේ B - සුභ පබ්බත
C - ගෝවින්ද මලය D - දඹදෙණිය (ල.4)
(iii) දෙවන පරාක්‍රමබාහු රාජයේ දේශපාලන සේවාවන් දෙකක් පැහැදිලි කරන්න. (ල.5)
(iv) දෙවන නාගරිකරණ අවධියේ ආර්ථික රටාවේ සිදුවූ වෙනස්කම් 03 ක් පැහැදිලි කරන්න. (ල.6)

06. (i) බ්‍රිතාන්‍ය ජාතිකයන් ඉන්දියාවේ පිහිට වූ වෙළඳ මධ්‍යස්ථාන 03 ක් නම් කරන්න. (ල.3)
(ii) බ්‍රිතාන්‍යයෙන් ශ්‍රී ලංකාව කෙරෙහි අවධානය යොමු කිරීමට බලපෑ ප්‍රධාන හේතු 02 ක් සඳහන් කරන්න. (ල.4)
(iii) 1818 නිදහස් අරගලය අසාර්ථක වීමට බලපෑ හේතු 02 ක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල.5)
(iv) 1848 නිදහස් අරගලයට කෝල්බෲක් ප්‍රතිසංස්කරණ යෝජනා බලපෑ ආකාරය කරුණු 03 ක් මගින් පැහැදිලි කරන්න. (ල.6)

07.(i) ශ්‍රී ලංකාවේ පළමු බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරු තිදෙනා පිළිවෙළින් නම් කරන්න. (ල. 3)
(ii) බ්‍රිතාන්‍යයන් විසින් මෙරට ආරම්භ කරන ලද වතුවගා බෝගයක් වන තේ වගාවේ සාර්ථකත්වයට බලපෑ හේතු 04 ක් ලියා දක්වන්න. (ල. 4)
(iii) බ්‍රිතාන්‍ය පාලන සමයේ මෙරට සිදුවූ සමාජීය වෙනස්කම් 02 ක් දක්වා ඒ පිළිබඳව පැහැදිලි කරන්න. (ල. 5)
(iv) නිදහසින් පසු ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තයේ දියුණුවට ගත්තා ලද ක්‍රියාමාර්ග 03 ක් පැහැදිලි කරන්න. (ල. 6)



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

## III කොටස

08. (i) ක්‍රි.ව. 1764 - 1765 වර්ෂ අතරතුර කාලයේ බ්‍රිතාන්‍ය රජය ඇමරිකන් ජනපදවාසීන් වෙත පැනවූ පනත් 03 ක් නම් කරන්න.

(ii) පහත A, B, C, D වලින් දක්වා ඇති එක් එක් කරුණය අදාල පිළිතුර අනුපිළිවෙළින් ලියා දක්වන්න. (ල. 3)

A - ප්‍රංශ විප්ලවය සිදුවන විට ප්‍රංශ පාලනයේ සිටි රාජවංශය

B - ඇමරිකන් විප්ලවයේ ආරම්භය ලෙස සැලකෙන සිදුවීම

C - 1917 මාර්තු මස සාර් පෙළපතට සිහසුන අත්හැරීමෙන් පසු පාලන බලය අත්පත් කරගත් පුද්ගලයා

D - 'සමාජ සම්මුතිය' නම් කෘතිය සම්පාදනය කළ දාර්ශනිකයා (ල. 4)

(iii) ප්‍රංශ විප්ලවයට බලපෑ දේශපාලන හේතු 02 ක් විස්තර කරන්න. (ල. 5)

(iv) රුසියන් විප්ලවයේ ප්‍රතිඵල 03 ක් විස්තර කරන්න. (ල. 6)

09. (i) දෙවන ලෝක සංග්‍රාමයට සම්බන්ධ වූ අක්ෂ කණ්ඩායම ට අයත් රටවල් තුන නම් කරන්න. (ල. 3)

(ii) වර්සෙල්ස් ගිවිසුම මගින් ජර්මනියට පනවන ලද දඬුවම් 02 ක් ලියා දක්වන්න. (ල. 4)

(iii) පළමුවන ලෝක සංග්‍රමයට බලපෑ හේතු 02 ක් පැහැදිලි කරන්න. (ල. 5)

(iv) II ලෝක සංග්‍රාමයේ ප්‍රතිඵල 03 ක් පැහැදිලි කරන්න. (ල. 6)



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

**ඉතිහාසය II**
**வரலாறு II**
**History II**

විභාග අංකය / சுட்டெண் / Index No: | | | | | | | | |

ශ්‍රේණිය / தரம் / Grade: | | |

1. (අ) i
1. (அ) i
1. (a) I







iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

1. (අ) (ii)
1. (அ) (ii)
1. (a) (ii)






iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

**ඉතිහාසය - 11 ශ්‍රේණිය**
**පිළිතුරු පත්‍රය**

| | | | | |
|---|---|---|---|---|
| 1 - 2 | 9 - 4 | 17 - 4 | 25 - 2 | 33 - 4 |
| 2 - 1 | 10 - 2 | 18 - 3 | 26 - 3 | 34 - 3 |
| 3 - 4 | 11 - 3 | 19 - 2 | 27 - 4 | 35 - 3 |
| 4 - 3 | 12 - 1 | 20 - 4 | 28 - 4 | 36 - 4 |
| 5 - 4 | 13 - 2 | 21 - 1 | 29 - 1 | 37 - 1 |
| 6 - 3 | 14 - 3 | 22 - 3 | 30 - 2 | 38 - 2 |
| 7 - 1 | 15 - 2 | 23 - 3 | 31 - 3 | 39 - 1 |
| 8 - 1 | 16 - 1 | 24 - 2 | 32 - 1 | 40 - 2 |

ආ) (i) A - I බුවනෙකබාහු රජු B - පෙනී තැපැල් සේවය C - සිංහලසංගෙ (සිංහල පෙරලිය, සිංහල කෝඩෙ
D - ක්‍රිස්ටෝපර් කොලොම්බස්
(ii) i) ගල්පාලම ii) අනුරාධපුරය iii) මල්වතු ඔය හරහා iv) පාලම් තැනීමේ
(iii) i) ඩී.එස්. සේනානායක මහතා ii) ජාතියේ පියා iii) ප්‍රථම අගමැති iv) ගල්ඔය

02. (i) අලුගල්ගේ, උඩමළල, බුන්දල, මිනිහාගල්කන්ද
(ii) ඉබ්බන්කඩුව, ගල්සොහොන්කනත්ත, යටිගල්පොත්ත, බෙරගල, හල්දුම්මුල්ල, රංචාමඩම, පොම්පරිප්පු
(iii) නිවාස ඉදිකිරිම
මැටි ඔරු සුසාන
මැටි බඳුන් තැනීම
යකඩ මෙවලම් නිපදවීම (විස්තරය 63 පිටුව - 64 10 ශ්‍රේණිය පෙළපොතේ 5 පාඩම් ඒකකය)
(iv) වාර්ෂික වර්ෂාපතන අගය
පසේ ස්වභාවය
භූ විෂමතාව
ජලවහනය
ස්වභාවික සම්පත් වල ව්‍යාප්තිය ( 10 ශ්‍රේණිය පෙළපොත 23 පිටුව)

03. (i) A- දේවානම්පියතිස්ස රජු, B- I ගජබාහු රජු, C- VI අග්ගබෝධි රජු
(ii) ප්‍රාදේශිය පාලකයන් කිහිප දෙනෙකු හා සටන් කර එම ප්‍රදේශ අත්පත් කරගෙන අනුරාධපුර පාලන මධ්‍යස්ථානය කර ගනිමින් ගොඩනැගීම.
- දසවෙනි රාජ්‍ය වර්ෂයේ දි දිවයිනේ ග්‍රාම සීමා සටහන් කිරීම.
- අනුරාධපුර නගරය අග නගරය කර ගැනීම
- අභය වැව, ජය වැව, ගාමිණි වැව යන වැව් ඉදිකිරිමට රාජ්‍ය අනුග්‍රහය ලබාදීම.
- වෙනත් ආගමිකයන් සඳහා වන්දනාමාන කටයුතු වලට අවශ්‍ය සිද්ධස්ථාන ඉදිකරදීම.

(iii) ප්‍රාදේශිය පාලන කටයුතු මෙහය වීම.
වැව් පද්ධතියක් පාලනය කිරීම.
(iv) • රෝහල් ඉදි කිරීම
බුද්ධදාස රජු ලංකාව පුරා රෝහල් ඉදිකිරිම
I උපතිස්ස රජු ගැබිණි මව්වරුන් වෙනුවෙන් සුවිශේෂ රෝහල් පිහිටුවීම
iv කාශ්‍යප රජු උණ රෝගීන් සඳහා විශේෂ රෝහල් පිහිටුවීම.
ආලාහන පිරිවෙන් සංකීර්ණය වැනි රෝහල් ඉදිකිරවීම
• රෝහල සඳහා වෛද්‍ය වරු පත් කිරීම - වෙදනා, මහ වෙදනා
• රොහල් වලට පහසුකම් සැපයීම
V මිහිඳු රජු රෝහල් වලට අවශ්‍ය පහසුකම් සපයා දීම, ගම්බිම් පිදීම, වෛද්‍ය උපකරණ ලබා දීම

04. (i) කිරිය, අමුණ, කර්‍ය්‍යය, පැල, කුරුණි, ලාහ
(ii) A - වදාළ B - සභාව C - කහාපණ D - නීති විශාරදයින්
(iii) වජු චුම්භට
අනුරාධපුරයේ අත්තිවාරම
සීගිරියේ නගර නිර්මාණ හා උද්‍යාන නිර්මාණය. (10 ශ්‍රේණිය පෙළපොත 68,69,70)
iv) • වැව් පරිපාලනය ඉඩම් පරිහරණය සම්බන්ධ බදු පනවමින් නීති පැනවීම. • වෙළදාම සම්බන්ධ නීති
උදා :- බදුලු ටැම් ලිපියට අනුව • පරිසරයේ සතුන් ආරක්ෂා කිරිම සම්බන්ධායන් පනවන ලද නීති.
උදා :- අමණ්ඩගාමිණී අභය රජු මාඝාත නීතිය පැනවීම. • වේවැල්කැටිය සෙල්ලිපියේ නීති ආදිය.

05. (i) අනුරාධපුරය, මාගම, පොලොන්නරුව



iexamhub www.iexamhub.com Your Trusted Partner for Exam Success Past Papers Model Answers Study Resources

(ii) A - සංඛ සෙනෙවි B - සුභ සෙන්පති C - බුවනෙකබාහු ආදිපාද D - වන්නි විජයබාහු

(iii) කාලිංසමාසයෙන් රජරට මුදවා ගැනීම
චන්ද්‍රභානුගේ ආක්‍රමණ 2 ක සාර්ථකව මැඩපවත්වා බෞද්ධ පූජනීය වස්තු රැකගැනීම.

(iv) අභස්දියෙන් වගා කටයුතු සිදුකිරීම, වානිජවාදී ආර්ථිකයක් බිහිවීම, විදේශ වෙළදාම ක්‍රියාත්මක වීම.

06. (i) කල්කටා, මදුරාසිය, බොම්බාය

(ii) ශ්‍රී ලංකාවේ පිහිටීමේ වැදගත්කම, ශ්‍රී ලංකාවෙන් කුරුඳු ඇතුළු වටිනා වෙළඳ ද්‍රව්‍ය ලබාගැනීම.

(iii) සටන මනා ලෙස සංවිධානය වී නොතිබීම, කැරලි නායකයන් අතර තිබූ මතබේද, ඉංග්‍රීසීන්ගේ මර්ධනකාරී පිළිවෙත වැනි...

(iv) රජයේ ඉඩම් ප්‍රතිපත්තිය, ගම්සභාව අඩපණ වීම, නව අධිකරණ ක්‍රමය, රජය හා මහජනතාව අතර සබඳතාව දුරස්වීම

07. (i) පෙඩ්රික් නෝත්, තෝමස් මේඩ්ලන්ඩ්, රොබට් බ්‍රවුන්රිග්

(ii) ලංකාවේ තේ සඳහා ලෝක වෙළදපොලේ ඉහල ඉල්ලුමක් පැවතීම, වියළි කලාපයේ හැර තේ වගාවට බොහෝ ප්‍රදේශ උචිත වීම, යන්ත්‍රසූත්‍ර භාවිතයෙන් ගුණාත්මකභාවයෙන් ඉහල තේ නිපදවීමට මෙරට සමත්වීම, ලාභදායි ශ්‍රමය ලබාගත හැකිවීම, මාර්ග පහසුකම් වැඩි දියුණු වීම හා ප්‍රවාහන පහසුකම් වැඩි දියුණු වීම.

(iii) මධ්‍යම පන්තියක් බිහිවීම. / කම්කරු පන්තියක් බිහිවීම.

iv) ගොවිජනපද පිහිටුවීම, මහවැලි සංවර්ධන යෝජනා ක්‍රමය, ව්‍යාපාරික කෘෂිකර්මාන්තය දියුණුවට ක්‍රියාමාර්ග ගැනීම, වී ගොවිතැන දියුණු කිරිමට වෙනස් සුවිශේෂි ක්‍රියාමාර්ග හඳුන්වා දීම

## II පත්‍රය

08. (i) සීනි පනත, මුද්දර පනත, මුදල් නෝට්ටු පනත

(ii) A - බූර්බෝන් B - බොස්ටන් තේ සාදය C - සෙරෙන්ස්කි D - රූසෝ

(iii) ප්‍රංශයේ පැවති රාජාණ්ඩු පාලනය , දැඩි හා දූෂිත පාලනයක් වීම, රජ පවුල ගතකල අධි සුඛෝපභෝගී ජීවිතය

(iv) ලෙනින්ගේ නායකයත්වයෙන් යුතු නව රජයක් පිහිටුවීම, සමාජවාදී දර්ශනය ලොව පුරා ව්‍යාප්ත වීම, සමූහ ගොවිපල ක්‍රමය ආරම්භ වීම

09. (i) ජර්මනිය / ඉතාලිය / ජපානය

(ii) • ජයග්‍රාහි රටවලට විශාල වන්දි මුදලක් ගෙවීමට ජර්මනියට සිදුවීම • හමුදා තබාගැනීම හා අවි ආයුධ නිෂ්පාදනය සඳහා ජර්මනියට සීමා පැමිණ වීම • ජර්මනිය ප්‍රංශයෙන් අල්ලාගෙන තිබු ඇල්සාස් ලෝරේන් යන ප්‍රදේශ ප්‍රංශයට පවරා දීම, යුරෝපයෙන් පිටත ජර්මනිය සතු වු යටත් විජිත ජයග්‍රාහි ජාතිකයන් අතර බෙදාගැනීම

(iii) • ජර්මනිය එක්සත් කිරීමේ ව්‍යාපාරයේදී ප්‍රංශය සතුරන් බවට පත්වීම. • දෙවන විලියම් අධිරාජ්‍යයාගේ ක්‍රියා කලාපය. • යටත් විජිත සඳහා වු තරගය. • අවි තරගය හා ජාතිවාදය වර්ධනය වීම. • ඔස්ට්‍රියාවේ ඔටුන්න හිමි කුමරා ඝාතනය

(iv) විශාල ලෙස දේපල හා ජීවිත හානි සිදුවීම
උදා :- ජපානයේ හිරෝෂිමා නගරයේ බෝම්බ ප්‍රහාරය
හිට්ලර් විසින් ජර්මනිය, පෝලන්තය, හංගේරිය වැනි රටවල යුදෙව්වන් මිලියන ගණනක් ගාල්කර මරා දැමීම

• ලෝකයේ බල කඳවුරු දෙකක් නිර්මාණය වීම
උදා :- මෙතෙක් ප්‍රංශයට හා බ්‍රිතාන්‍යයට ලෝකයේ හිමි ව තිබු ප්‍රධාන ස්ථානය අහිමි වු අතර ඇමෙරිකාව, හා රුසියාව ලෝකයේ බලවත් රාජ්‍ය වීම. එම රටවල් දෙක බල කඳවුරු 2 ක් නිර්මාණය කර ගැනීම. රහස් ඔත්තු සේවා සංවිධාන පිහිටුවා ගැනීම. ආධාර වැඩ පිළිවෙළවල් දියත් කිරීම මගින් තමන්ගේ කඳවුරට ලෝකයේ අනෙකුත් රාජ්‍යයන් එකතු කර ගැනීමට ක්‍රියා කිරීම

• එක්සත් ජාතීන්ගේ සංවිධානය පිහිටවීම.
උදා :- ෆ්රැන්ක්ලින් රූස්වෙල්ට් ඇමෙරිකානු ජනාධිපතිගේ මූලිකත්වයෙන් ආරම්භක සාමාජික රටවල් 51 ක් සහභාගි කර ගනිමින් 1945 ඔක්තෝම්බර් 24 දින එක්සත් ජාතීන්ගේ සංවිධානය පිහිටුවීම. එය ආරම්භයේ ප්‍රධාන ආයතන 06 කින් සමන්විත විය.



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources








www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers · Model Answers · Study Resources